**මීරිගම ප්‍රාදේශීය සභාවේ - 2021**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1. තත්ත්වාගණනය කළ මතය

**-----------------------------**

මීරිගම ප්‍රාදේශීය සභාවේ 2021දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මීරිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

-----------------------------------------------------------------------------

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2021 වර්ෂයේ මිලදී ගන්නා ලද දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු.49,850 ක් වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |
| (ආ) | මීරිගම දුම්රිය පොල අසල වාණිජ සංකීර්ණයේ කඩ කාමර වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු පෙර මුදල් රු.46,591,800 ක් ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | | |
| (ඇ) | 2020 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලද පුස්තකාල පොත් වටිනාකම රු.144,270 ක් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට පරිත්‍යාග ලෙස ගිණුම්ගත කර තිබුණු අතර, ඒ හේතුවෙන් ඊට අදාල ක්‍රමක්ෂය වටිනාකම වූ රු.14,427 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දී පරිත්‍යාග ලෙස ලද රු.65,615 ක් වටිනා පුස්තකාල පොත් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කල යුතු වුවද, වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |

<table>
<tr>
<td>(ඉ )</td>
<td>සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් කර මුදල් ගෙවන ලද එකතු වටිනාකම රු.3,785,927 ක් වූ ව්‍යාපෘති 05 ක් දේපළ, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.</td>
<td rowspan="3">2022 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරිමේදී, නිවැරදි කිරීමට කටයුතු කරමි.</td>
<td rowspan="3">නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.</td>
</tr>
<tr>
<td>(ඊ)</td>
<td>වර්ෂ 3 ත් 10 ත් අතර කාලයකදී වැඩ අවසන් කරන ලද නමුත්, මුදල් ප්‍රතිපූර්ණය නොවූ එකතු වටිනාකම රු.17,186,847 ක් වූ ව්‍යාපෘති 214 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කර්මාන්ත ණයගැතියෝ සහ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර තිබුණද, එම වටිනාකම ණය හිමි සහ දේපළ, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර නොතිබුණි.</td>
</tr>
<tr>
<td>(උ)</td>
<td>2022 ජනවාරි 04 දිනැති හා අංක LGD/10A/නගි/2021 දරන පළාත් පාලන කොමසාරිස්වරයාගේ චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ගණනය කිරීමේදී, රු.5,000 ට වඩා අඩු ප්‍රත්‍යාගණනය / ගත් මිල ඇති ලී බඩු හා උපකරණ ස්ථාවර වත්කම්වලින් ඉවත්කර, භාණ්ඩ වට්ටෝරු පොත්වල ඇතුලත් කර වාර්ෂික සමීක්ෂණවලට ඇතුලත් කළයුතු බවද, එම වියදම් එම වර්ෂයේ අයභාර වියදමක් ලෙස සැලකිය යුතු බවද, ස්ථාවර වත්කම් ලෙස හඳුනාගන්නා වටිනාකම ගිණුම් ප්‍රකාශනවල සටහන් තුල පැහැදිලිව ඇතුළත් කළයුතු බවද අවධාරණය කර තිබුණි. නමුත් ප්‍රාදේශීය සභාවේ එකතු වටිනාකම රු.213,900 ක් වූ එවැනි අයිතම 83 ක් දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබීම හේතුවෙන් දේපළ, පිරියත හා උපකරණ ශේෂය හා සමුච්චිත අරමුදල් ශේෂය වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.</td>
</tr>
</table>

## 1.6.2. ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට කාල විශ්ලේෂණ වාර්තාව අනුව කර්මාන්ත ණයගැති ශේෂය රු.69,840,302 ක් පැවතුණි. මෙයින් වසර 1 ත් 3 ත් අතර කාලයක සිට අයවීම් හිඟව පැවතුණු මධ්‍යම රජයේ ව්‍යාපෘති 290 ක් සඳහා රු.22,353,012 ක් සහ පළාත් සභා ව්‍යාපෘති 28 ක් සඳහා රු.1,557,599 ක්ද , වසර 3 ත් 5 ත් අතර කාලයක සිට අයවීම් හිඟව පැවති මධ්‍යම රජයේ ව්‍යාපෘති 43 ක් සඳහා රු.4,706,807 ක් සහ වසර 5ත් 10ත් අතර කාලයක සිට හිඟව පැවති මධ්‍යම රජයේ ව්‍යාපෘති 42 ක රු.5,039,397 ක් 2022 අගෝස්තු 12 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | මෙහිදී මධ්‍යම රජයෙන් ලැබිය යුතු සියලුම මුදල් 10% අතරුදවුම් වේ. පළාත් සභා යටතේ ලැබිය යුතු මුදල් වන්නේ අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ වූ 10% අතරුදවුම් මුදල් වේ. අතරුදවුම් ලබා ගැනීමට වවුචර් ඉදිරිපත් කර ඇති අතර, මුදල් ප්‍රතිපූර්ණය වූ පසු ණයගැතියන් නිදහස් කල හැකිය. | කර්මාන්ත ණයගැති උපලේඛන විශ්ලේෂණය කර සුදුසු ක්‍රමවේදයක් යොදා ගනිමින් සහ ලිපිගොණු පරීක්ෂා කර, අයකර ගතයුතුබවට නිශ්චය කර ගත් කර්මාන්ත ණයගැති ශේෂයන් අය කර ගැනීමට කටයුතු කල යුතුය. |

## 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගිණුම් විෂයයන් 03 කට අදාල ව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපලේඛන අනුව ශේෂය අතර රු.280,296 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කරමි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.4. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.3,730,340 ක් වූ ගිණුම් ශේෂයන් 3 ක් සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | රු.10,340 ක් කපා හැරීමට යොමු කර ඇතත් අනුමැතිය ලැබී නැත. රු.2,143,000 ක් ලේඛණ වල ගිණුම් ශේෂය නිවැරදි කිරීමට කමිටුවක් පත් කර ඇත. | උපලේඛන සකස්කර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු.7,961,000 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.65,540,331 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

### 2.2.1. වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට වරිපනම් ඒකක 4,926 කට අදාලව රු.8,388,063 ක් වූ වරිපනම් හිඟ ශේෂය තුල ඒකක 518 කට අදාලව වර්ෂ 10 ට වැඩි කාලයක සිට අයවිය යුතු රු.3,442,048 ක්ද, ඒකක 438 කට අදාලව වර්ෂ 5 ත් 10 ත් අතර කාලයක සිට අයවිය යුතු රු.1,027,396 ක්ද, ඒකක 622 කට අදාලව වර්ෂ 3 ත් 5 ත් අතර කාලයක සිට අයවිය යුතු රු.1,106,851 ක්ද ඒකක 1,834 කට අදාලව වර්ෂ 1 ත් 3 අතර කාලයක සිට අයවිය යුතු රු.1,857,345 ක් සහ ඒකක 1,514 කට අදාලව වර්ෂ 1 ට අඩු කාලයක සිට අයවිය යුතු රු.954,423 ක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය නිසා කාර්යාල කටයුතු සීමා කිරීමෙන්, නිසි ක්‍රමවේද අනුගමනය කිරීමට නොහැකි වීම නිසා හිඟ වරිපනම් එකතු කිරීමට අපහසු තත්වයක් ඇතිවිය. 2022 වර්ෂය තුලදී හැකි උපරිම හිඟ වරිපනම් ඒකක ප්‍රමාණයක් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ වරිපනම් ශේෂයන් විශ්ලේෂණය කර සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කර හෝ අයකර ගැනීම් පැහැරහරින ලද පාර්ශවයන් හඳුනාගෙන හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වරිපනම් බදු තක්සේරුව සම්බන්ධයෙන් ඇතිවූ විරෝධතාවන් නිසා කීනදෙණිය, කණ්ඩලම පාර වරිපනම් අංක 102/02 දරන දේපල සඳහා රු.217,052 ක් වර්ෂ 2 ක කාලයක සිට අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | ඒ පිලිබඳ කමිටුවක් පත්කර, එම ගැටළුව පිලිබඳව කටයුතු කර, හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.2.2. බදුකර කුලී**

**--------------**

| | | |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට මීරිගම උප කාර්යාලයට අදාලව ලැබිය යුතු බදුකර කුලී (ටෙන්ඩර් කඩ කුලී) ආදායම රු.1,140,834 ක් වී තිබුණු අතර කාල විශ්ලේෂණය අනුව එයින් රු.842,334 ක් අවුරුදු 01 ත් 03 ත් අතර හිඟව පවතින ශේෂයක් බව නිරීක්ෂණය විය. | වසර 1-3 අතර හිඟ ශේෂ පවතිත බදුකරුවන් වෙත හිඟ මුදල් ගෙවන ලෙස දන්වා ලිපි යවා ඇත. මේ පිළිබඳව 2019.11.30 මුදල් කමිටුව වෙතද දක්වා ඇත. හිඟ මුදල් අයකිරීමට කටයුතු කරමි. | හිඟ බදුකර කුලී උපලේඛන විශ්ලේෂණය කර සුදුසු ක්‍රමවේදයක් යොදා ගනිමින් කඩ හිමියන්ගෙන් අය කර ගැනීමට හෝ කුලී අය කිරීම පැහැර හැරීමට වගකිවයුත්තන් නිශ්චයකර ඔවුන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

**2.2.3. කඩ කුලී**

**----------**

| **විගණන නිරීක්ෂණය**<br>**----------------------** | **සභාවේ අදහස් දැක්වීම**<br>**------------------------** | **නිර්දේශය**<br>**------------** |
|---|---|---|
| මුල් අයිතිකරු මිය යාම හෝ විදේශගත වීම, අතුරු බදු හරවා නොගැනීම, පෙර මුදල් ගෙවා සම්පූර්ණ නොකිරීම වැනි හේතු නිසා වර්ෂ 3 ක කාලයක සිට මීරිගම උප කාර්යාලයේ ගිවිසුම් නොමැති කඩ කාමර 85 ක් පැවති අතර නව ගිවිසුම් ඇතිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩ කාමර 35 ක් දුම්රියපල වාණිජ සංකීර්ණයේ කඩ කාමර වේ.පෙර මුදල් ගෙවා අවසන් නැති නිසා ගිවිසුම්ගත නොවුනි. පෙර මුදල් වලින් කොටසක් කපා හැරීම සඳහා කමිටුවක් පත්කර එම නිර්දේශ පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇත. තවත් 05ක් අතුරු බදු හැරවීමට ප.පා.කො වෙත අනුමැතියට යවා ඇත. අනුමැතිය ලැබූ පසු ගිවිසුම් ගත වීමට කටයුතු කරමි. ඉතිරි කඩ 45 සම්බන්ධයෙන් මහා සභාව වෙත යොමුකර තීරණයක් ගැනීමට කටයුතු කරමි. | ගිවිසුම් නොමැති කඩ කාමර හිමිකරුවන් ගිවිසුම්ගත කරවීමට කටයුතු කළ යුතුය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1. කළමනාකරණ අකාර්යක්ෂමතාවය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 25/2014 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ස්ථිර කරන ලද 56 ක සේවක සංඛ්‍යාවක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමතකරවා ගැනීමට මේ දක්වා සිදුකර නොමැති බැවින් සමාලෝචිත වර්ෂය තුලදී එම සේවකයින් වෙනුවෙන් ලබාගත හැකිව තිබූ රු.2,634,737ක වැටුප් ප්‍රතිපූර්ණ ලැබී නොතිබුණි. | 2021 වර්ෂයේ ස්ථිර සේවකයින්ගේ වැටුප් හා දීමනා ගෙවීම සභා අරමුදලින් කරන අතර, පසුව ප්‍රතිපූර්ණය කරනු ලබයි. එහෙත් 25/2014 චක්‍රලේඛය ප්‍රකාරව ස්ථිර කරන ලද සේවකයින්ගේ වැටුප් මුදල සම්පූර්ණයෙන්ම ප්‍රතිපූර්ණය කරනු නොලබයි. එම නිසා හිඟ ප්‍රතිපූර්ණයක් පවතී. මීට පෙර වර්ෂවලද එසේ හිඟ ප්‍රතිපූර්ණ තිබූ අතර, එය පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ලිපියකට අනුව කපාහරින ලදී. | අංක 25/2014 චක්‍රලේඛය ප්‍රකාරව ස්ථිර කරන ලද සේවකයින් පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී සේවකයින් සංඛ්‍යාව අනුමත කරවා ගැනීමටත්, වැටුප් ප්‍රතිපූර්ණය කරවා ගැනීමටත් කටයුතු කල යුතුය. |
| (ආ) | 2021 වර්ෂය තුල මහජන පැමිණිලි 557 ක් ලැබී තිබුණ අතර එයින් 2022 අගෝස්තු 08 දින වනවිට විසඳා අවසන්කර තිබුණේ පැමිණිලි 266 ක් පමණි. | මහජන පැමැණිලි වලින් විශාල ප්‍රමාණයක් ඇත්තේ අනතුරුදායක ගස් සම්බන්ධයෙනි. ඉන් බොහෝ ප්‍රමාණයකට තෙවන සිහිකැඳවීම් ද යවා ඇති අතර, මේ වන විට මුදල් ප්‍රතිපාදන හිඟයක් පවතින බැවින්, මුදල් කමිටුවක් මාර්ගයෙන් ප්‍රතිපාදන වෙන්කොට ගස් කැපීම සිදු කරමින් පවතින බව දන්වමි. | මහජන පැමිණිලි ඉතා ඉක්මනින් විසඳීමට කටයුතු කළ යුතුය. |

### 3.2. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේවයේ යෙදී සිටි ලේකම්වරයා 2019 නොවැම්බර් 30 දින විශ්‍රාම යාමෙන් පසු ස්ථිර ලේකම්වරයෙකු පත් නොකර එදින සිට වැඩ බලන ලේකම්වරයෙකු පත්කර තිබුණි. | පුරප්පාඩු, කාර්තු වාර්තා මගින් වර්ෂය තුල සෑම මාස 3කට වරක්ම පළාත් පාලන දෙපාර්තමේන්තුවට, ප්‍රධාන ලේකම් කාර්යාලයට හා පළාත් පාලන අමාත්‍යංශ වෙත දන්වා ඇත. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට සේවකයන් දෙදෙනෙකුගෙන් අයවිය හිඟව පැවති සේවක ණය ශේෂය රු.365,762 ක් වූ අතර, මෙයින් සේවය අතහැර ගිය වසර 04 කට වඩා පැරණි එක් සේවකයෙකුගේ අයවීම් හිඟව පැවති වටිනාකම රු.131,853 ක් වී තිබුණි. | එක් සේවකයෙකුගේ හිඟ මුදල් ආදේශක සේවා කාලයට අදාල සේවා නියුක්තියන්ගේ භාර අරමුදලේ මුදල් ලැබුනු විගස, ගෙවා අවසන් කරන බව ප්‍රකාශ කර ඇත. එක් සේවකයෙකුගේ හිඟ මුදල් ඇපකරුගෙන් මාසිකව අයකර ගනිමින් පවතින බවද දන්වමි. | හිඟ සේවක ණය අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3. වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොදු කටයුතු සඳහා භාවිතා කරනු ලබන පොදු ඉඩම් 16 ක් 2022 මැයි 12 දින වන විටත් සභාවට පවරාගැනීමට කටයුතුකර නොතිබුණු අතර එම ඉඩම්වලින් ඉඩම් 06 ක වටිනාකමද හඳුනාගෙන නොතිබුණි. | වටිනාකම හදුනා නොගත් ඉඩම් 06 සඳහා වටිනාකම් හදුනා ගැනීමට කටයුතු කරන බවත්, සභාවට පවරා නොගත් පොදු ඉඩම් 16 හැකි ඉක්මනින් පවරා ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. | පවරා නොගත් පොදු ඉඩම් පවරා ගැනීමට කටයුතු කල යුතුය. |